පූජ්‍ය දේවගොඩ පියරතන හිමි,
සංස්කෘත අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
*Poster*

# ශ්‍රී ලාංකේය ලෝහමය ගෘහෝපකරණ නිර්මාණයෙහි ඉතිහාසය

ශ්‍රී ලාංකේය ලෝහ කර්මාන්තය ක්‍රි.පූ. 07 වන සියවසෙහි ආරම්භ වූ බව පුරාවිද්‍යාත්මක සාධකයන්ගෙන් සනාථ වේ. රොබට් නොක්ස්ගේ වාර්තාවන්ගෙන් ද ආනන්ද කුමාරස්වාමි මහතාගේ පර්යේෂණයන්ගෙන් ද ශ්‍රී ලාංකේය ලෝහ කර්මාන්තයේ ඉතිහාසය පිළිබඳ තොරතුරු අනාවරණය වේ. ලෝහ කර්මාන්තයේ ආරම්භයත් සමග දෛනික ජීවිතයේ විවිධ කාර්යයන්හි ප්‍රයෝජනවත් වූ ගිර, බුලත් තට්ටු, පඩික්කන්, ආහාර තැටි, කිල්ලෝට ආදි ලෝහමය ගෘහෝපකරණ ඈත අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කළ බව ඉතිහාසයෙහි දක්වේ.

සේනා සංවිධානයෙහි නිරත වූ පණ්ඩුකාභය කුමරුට ගිරිකණ්ඩ නම් ප්‍රදේශයේ දී පාලී නම් ක්ෂත්‍රිය තරුණිය රන් තැටියක තබා බත් පිළිගැන්වූ බව *මහාවංශයෙහි* දක්වේ. පණ්ඩුකාභය රාජ්‍ය යුගයට පෙර සිට ම ශ්‍රී ලාංකේය ලෝහමය ගෘහෝපකරණ නිර්මාණය සිදු වූ බව මෙයින් තහවුරු වේ. විජය කුමරුගේ අභිෂේකය සඳහා මධුරා පුරයෙන් පැමිණි අටළොස් ශ්‍රේණියක ශිල්පීන් අතර ද දුමින්දාගමනයේ දී පැමිණි අටළොස් ශ්‍රේණියක ශිල්පීන් අතර ද ලෝහමය ගෘහෝපකරණ නිර්මාණයෙහි නිරත වූ ලෝහ භාණ්ඩ ශිල්පීන් වූ බව නිගමනය කළ හැකි ය. ශ්‍රී මහා බෝධි ශාඛාව සමග රන් කළ 08 ක් ද රිදී කළ 08 ක් ද ශ්‍රී ලංකාවට රැගෙනවිත් ඇත. ශ්‍රී ලාංකේය ලෝහ භාණ්ඩ ශිල්පීන්ට මෙම රන් රිදී කළ ස්වකීය නිර්මාණ කාර්යයෙහි ලා පූර්වාදර්ශ වන්නට ඇත.

ලෝහ ප්‍රාසාදයෙහි විසූ භික්ෂූන්ගේ පරිභෝජනය සඳහා ජලය පුරවන ලද රන් සැලියක් විය. මහාවිහාරයෙහි වූ මහාපාලී දාන ශාලාව සියළු උපකරණයන්ගෙන් සමන්විත වූ බව *මහාවංශයෙහි* දැක්වේ. ගැමුණු හා තිස්ස යන කුමාරවරුන් දෙදෙනා විසින් ආහාර අනුභව කිරීම සඳහා රන් තලි භාවිත කර ඇත. ජල පරිභෝජනය සඳහා ලෝහමය තැටි ද ලෝහමය ඔරු ද භාවිත වූ බව ඉතිහාසයෙහි දක්වේ. යම් යම් දේ දෝවනය කිරීමට අවශ්‍ය ජලය රැස්කර තබා ගැනීම සඳහා ධාතුසේන රජු ලෝහමය ඔරු සොළොසක් මහාවිහාරයට පූජා කළේය. මේ සාධක අනුව ඈත අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ දියුණු ලෝහමය ගෘහෝපකරණ නිර්මාණ සම්ප්‍රදායක් පැවති බව පැහැදිලි වේ. එකී සම්ප්‍රදාය කෙරෙහි සංස්කෘත ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථාගත සිද්ධාන්තයන්ගේ බලපෑම ද දක්නට ලැබේ.